# සමාජ සේවා දෙපාර්තමේන්තුවෙහි පුනරුත්ථාපන සහායක තනතුර සඳහා කොන්ත්‍රාත් පදනම මත බඳවා ගැනීමේ පරිපාටිය

**01. සම්බන්ධ වන ආයතන**

| | | | |
|---|---|---|---|
| 1.1 දෙපාර්තමේන්තුව | : සමාජ සේවා | යොමු අංකය:SS/1/1/1/13 | දිනය: 2012.08. |
| 1.2 අමාත්‍යාංශය | : සමාජ සේවා | යොමු අංකය:MSS/3/2/1/ස.සේ./ SOR/21 | දිනය: 2012.05.04 |
| 1.3 කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් තනතුරු අනුමත කිරීම: | | යොමු අංකය: DMS/C3/40 | දිනය: 2011.03.10 |
| 1.4 ආයතන අධ්‍යක්ෂ ජනරාල්ගේ නිර්දේශය : | | යොමුඅංකය:EST-3/RECRU/ 04/6931 | දිනය:2012.01.14 |
| 1.5 ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ නිර්දේශය : | | යොමු අංකය:NSCC/5/40/SR-1 | දිනය:2012.03.08 |
| 1.6 රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය : | | යොමු අංකය:PSC/EST/4/1/40/ 2/2012 | දිනය:2012.07.26 |

**02. පත් කිරීම් බලධරයා පිළිබඳ විස්තර**

2.1 පත් කිරීම් බලධරයා: රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් බලය පවරන ලද සමාජ සේවා අධ්‍යක්ෂ

**03.පැවරෙන කාර්ය භාරය පිළිබඳ පොදු නිර්වචනය:**

ආයතනයන්හි කාර්යයන් ඉටු කිරීම හා පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය වන පොදු මූලික අවශ්‍යතාවයන් අතුරින් නිශ්චිත අර්ධ ශිල්පීය හෝ ශිල්පීය නිපුණතාවයකින් තොරව ඉටු කළ හැකි දෙපාර්තමේන්තුවට විශේෂ වූ කාර්ය පථයට අයත් කාර්යය භාරයන් දෙපාර්තමේන්තු ප්‍රධානියා / පත්වීම් බලධාරියා විසින් මෙම සේවක ගණයට පවරනු ලැබේ.

**04. තනතුරේ ස්වභාවය** :මෙම තනතුර කොන්ත්‍රාත් පදනම මත ඇති කළ තනතුරක් වන අතර, ස්ථිර පත්වීමක් ලබාගැනීමට හෝ ස්ථිර නිලධාරීන්ට හිමි වරප්‍රසාද සඳහා හෝ හිමිකම් නොමැති තනතුරකි.

**05. මාසික දීමනාව** : දීමනාවක් ලෙස මාසිකව රු.12000/- ක් හිමි වේ.

**06. කොන්ත්‍රාත් පදනම යටතේ බඳවා ගැනීමට අනුමත තනතුරු නාම, තනතුරු සංඛ්‍යාව හා ඒවාට පැවරෙන කාර්යයන්**

| අනුමත තනතුරු නාම | අනුමත තනතුරු සංඛ්‍යාව | කාර්යයන් |
|---|---|---|
| පුනරුත්ථාපන සහායක | 09 | මත් ලෝලීන් ආයතනයට ඇතුලත් කිරීමට අදාළ මූලික තොරතුරු ලබා ගැනීම, නේවාසික සේවා ලාභීන්ගේ හැසිරීම නිරීක්ෂණය කිරීම, දෛනික වැඩසටහන් තුලින් දක්වා ඇති පුනරුත්ථාපන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම හා බාහිරින් පැමිණෙන සම්පත්දායකයින් වෙත |

| | | |
|---|---|---|
| | | සහාය වීම හා සේවා ලාභීන්ගේ ආරක්ෂාව සැපයීම, නවක සේවා ලාභියෙකුගේ කායික විරමන ලක්ෂණ පවතින කාලය තුළ ඔවුන් පිළිබඳ විශේෂ අවධානයක් යොමු කිරීම හා පුනරුත්ථාපන කටයුතු සඳහා දිරි ගැන්වීම, සේවාලාභීන් අතර ඇතිවන ගැටලුකාරී තත්වයන් විසඳීමට මැදිහත් වීම හා ඒ සම්බන්ධ වාර්තා ආසන්න අධීක්ෂණ නිලධාරීන් වෙත ඉදිරිපත් කිරීම, ආයතන පරිශ්‍රය පිරිසිදුව තබා ගැනීම, සේවාලාභීන්ගේ මූලික පහසුකම් ලබාදීම, උපදේශකවරුන්, අධීක්ෂණ නිලධාරීන් හා ආයතන ප්‍රධානියා විසින් පවරන අනෙකුත් රාජකාරී. |

6.2 ඒකාබද්ධ නිලධර සංඛ්‍යාව : 09

**07. කොන්ත්‍රාත් පදනම මත බඳවා ගැනීමේ සුදුසුකම් :**

7.1 අධ්‍යාපන සුදුසුකම් :අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයෙන් යටත් පිරිසෙයින් සම්මාන දෙකක් සහිතව එක් වරකදී විෂයයන් හයකට නොඅඩුව සමත් වී තිබීම.

7.2. වෘත්තිය සුදුසුකම් : තනතුරට අදාල ක්ෂේත්‍රයේ ලබා ඇති වෘත්තිය සුදුසුකම් විශේෂ සුදුසුකමක් ලෙස සැකේ.

7.3 පළපුරුද්ද : තනතුරට අදාල ක්ෂේත්‍රයේ පළපුරුද්ද විශේෂ සුදුසුකමක් ලෙස සැලකේ.

7.4 කායික සුදුසුකම් :සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

7.5 වෙනත් :1. ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුයි.
2. අයදුම්කරුවන් විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය.
3. තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සුදුසුකම්, එම සුදුසුකම් සම්පූර්ණ කළ යුතු බවට අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් කරනු ලබන දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

**08. වයස**

8.1 අවම සීමාව : අවුරුදු 18 ට නොඅඩු විය යුතුය.

8.2 උපරිම සීමාව : අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

**09. බඳවා ගැනීමේ ක්‍රමය** : ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයෙන් උපරිම ලකුණු සංඛ්‍යාවක් ලබා ගන්නා අයදුම්කරුවන් අතරින් බඳවා ගැනීමට අපේක්ෂිත සංඛ්‍යාව බඳවා ගැනේ.

9.1 ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය

| පරීක්ෂා කර ලකුණු ලබා දෙනු ලබන ප්‍රධාන ශීර්ෂ | උපරිම ලකුණු ප්‍රමාණය | තෝරා ගැනීමට සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| 1.අධ්‍යාපන සුදුසුකම් (බඳවා ගැනීමේ මූලික සුදුසුකම්වලට අමතරව) | 20 | අදාළ නොවේ |
| 2.පළපුරුද්ද | 20 | |
| 3.ක්ෂේත්‍රයට අදාලව රජය පිළිගත් ආයතනයක හදාරා ඇති පාඨමාලා සඳහා | 10 | |
| 4.ලබා ඇති විශේෂ වෘත්තීය පුහුණුව සඳහා | 30 | |
| 5.ක්‍රීඩා කුසලතා සඳහා | 15 | |
| 6.සම්මුඛ පරීක්ෂණයේ දී දක්වන කුසලතා | 05 | |
| **එකතුව** | **100** | |

9.1.1 ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය පත්කරන බලධරයා : සමාජ සේවා අධ්‍යක්ෂ හා / හෝ

9.1.2 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය (ලකුණු ලබා දෙනු නොලැබේ.)
ඉටු කර ගැනීමට අපේක්ෂිත අරමුණු : සුදුසුකම් පරීක්ෂා කිරීම

9.1.3 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය පත් කරනු ලබන බලධාරියා
: සමාජ සේවා අධ්‍යක්ෂ

**9.3 අයදුම්පත් කැඳවීමේ ක්‍රමය** : ප්‍රසිද්ධ දැන්වීම් මගින්.

| | | | |
|---|---|---|---|
| සකස් කලේ | :- | පරීක්ෂා කලේ | :- |
| අත්සන | : | අත්සන | : |
| නම | :කේ.එච්. දිනිති සජ්විකා | නම | : බී.ජී. අනූෂා |
| තනතුර | : රාජ්‍ය කළමනාකරණ සහකාර (III) | තනතුර | : සහකාර අධ්‍යක්ෂ. |
| දිනය | : 2012.08. | දිනය | : 2012.08. |

අත්සන :
නම : හේමචන්ද්‍ර හේවගේ
තනතුර : සමාජ සේවා අධ්‍යක්ෂ.
දිනය : 2012.08.
නිල මුද්‍රාව :

යොමු අංකය : **MSS/3/2/1/ස.සේ./SOR/21**

සමාජ සේවා දෙපාර්තමේන්තුවෙහි කොන්ත්‍රාත් පදනම මත පුනරුත්ථාපන සහායක තනතුර සඳහා යෝජිත මෙම බඳවා ගැනීමේ පටිපාටිය අනුමත කිරීම නිර්දේශ කරමි.

අත්සන :

නම :එම්.ජ්. ඉමෙල්ඩා සුකුමාර්

ලේකම්

සමාජ සේවා අමාත්‍යාංශය

දිනය :2012. නිල මුද්‍රාව :

---

යොමු අංකය :

සමාජ සේවා දෙපාර්තමේන්තුවෙහි කොන්ත්‍රාත් පදනම මත පුනරුත්ථාපන සහායක තනතුර සඳහා වන මෙම බඳවා ගැනීම් පටිපාටිය 2012.07.26 දින රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලදි.

අත්සන :

නම :

ලේකම්

රාජ්‍ය සේවා කොමිෂන් සභාව

දිනය :2012. නිල මුද්‍රාව :

<u>ඇමුණුම 01</u>

**පුනරුත්ථාපන සහායක තනතුරට බඳවා ගැනීම සඳහා වන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය**

| පරීක්ෂා කර ලකුණු ලබා දෙනු ලබන ශීර්ෂ | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| **1.අධ්‍යාපන සුදුසුකම්**<br><br>බඳවා ගැනීමේ මූලික සුදුසුකම් ලෙස දක්වනු ලබන අ.පො.ස. සා.පෙළ විභාගයේ දී සාමාර්ථ ලබා ඇති විෂයයන් හය හා සම්මාන දෙකට අමතරව සමත්ව ඇති විෂයයන් හා ලබා ඇති සම්මාන සඳහා විෂයයන් 08 ක උපරිමයකට යටත්ව ලකුණු ලබා දේ.<br>i. සාමාන්‍ය සාමාර්ථය - ලකුණු 02<br>ii. සම්මාන සාමාර්ථය - ලකුණු 03<br>iii. අධි සම්මාන සාමාර්ථය - ලකුණු 05 | 20 | 40% |

| | | |
|---|---|---|
| **2.පළපුරුද්ද**<br><br>මත්ද්‍රව්‍ය නිවාරණ හෝ සමාජ සේවා උපදේශාත්මක කටයුතු සම්බන්ධව ලබා ඇති පළපුරුද්ද<br>වර්ෂයකට ලකුණු 06<br>මාස 09 - 12 ලකුණු 04<br>මාස 06 - 09 ලකුණු 03<br>මාස 03 - 06 ලකුණු 02 | 15 | |
| **3.තනතුරට හිමි ක්ෂේත්‍රයට අදාලව රජය පිළිගත් ආයතනයක හදාරා ඇති පාඨමාලා සඳහා**<br><br>මාස 01 ට අඩු ලකුණු 04<br>මාස 01 - 06 ලකුණු 07<br>මාස 06 ට වැඩි - ලකුණු 10 | 10 | |
| **4.ලබා ඇති විශේෂ වෘත්තීය පුහුණුව සඳහා (කෘෂිකර්මය, ඉලෙක්ට්‍රොනික් තාක්ෂණය, ලෝහ වැඩ ශිල්පය, පරිගණක ආදී)**<br><br>වර්ෂයකට ලකුණු 06<br>මාස 09 - 12 ලකුණු 04<br>මාස 06 - 09 ලකුණු 03<br>මාස 03 - 06 ලකුණු 02 | 30 | |
| **5.ක්‍රීඩා කුසලතා සඳහා**<br><br>ජාතික මට්ටමේ ජයග්‍රහණයන් සඳහා -7<br>දිස්ත්‍රික් මට්ටමේ ජයග්‍රහණයන් සඳහා -6<br>පළාත් මට්ටමේ ජයග්‍රහණයන් සඳහා -5<br>කොට්ඨාශ මට්ටමේ ජයග්‍රහණයන් සඳහා -3 | 15 | |
| **6.සම්මුඛ පරීක්ෂණයේ දී පිළිඹිබු කරන ආකල්ප හා පෞරුෂය සඳහා** | 10 | |

| | | | |
|---|---|---|---|
| සකස් කලේ | :- | පරීක්ෂා කලේ | :- |
| අත්සන | : | අත්සන | : |
| නම | :කේ.එච්. දිනිති සජීවිකා | නම | : එන්.වසන්තිකා ඩයස් |
| තනතුර | : රාජ්‍ය කළමනාකරණ සහකාර (III) | තනතුර | : සහකාර අධ්‍යක්ෂ. |
| දිනය | : 2011.12. | දිනය | : 2011.12. |

අත්සන : 

නම : හේමචන්ද්‍ර හේවගේ

තනතුර : සමාජ සේවා අධ්‍යක්ෂ.

දිනය : 2011.12.

නිල මුද්‍රාව : 